# මැතිවරණ කොමිෂන් සභාව
## தேர்தல் ஆணைக்குழு

පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல் : 011-2868426

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය (10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய (10107)

*web : www.slelections.gov.lk*  *e-mail : info@slelections.gov.lk*


| | | |
|---|---|---|
| මගේ අංකය : PRE/2024/09<br>எனது இல. | ඔබේ අංකය :<br>உமது இல. | දිනය : 2024.07.29<br>திகதி |

චක්‍රලේඛ අංක :- PRE/2024/15
සියළුම තේරීම්භාර නිලධාරීන් සහ
නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,

<u>ජනාධිපතිවරණය - 2024</u>
<u>තැපෑලෙන් ඡන්දය දීම</u>

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 23 වන වගන්තියේ විධිවිධානවලට අනුව ජනාධිපතිවරණය පැවැත්වීම සම්බන්ධයෙන් වූ මැතිවරණ කොමිෂන් සභාවේ නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 2024.07.26 දින සිට දින දහයක් ඇතුළත තැපැල් ඡන්ද ඉල්ලුම්පත් අදාළ තේරීම්භාර නිලධාරීන් වෙත ලැබිය යුතුය. ඒ අනුව ඉල්ලුම්පත් භාරගැනීම 2024.07.26 දින ආරම්භ වී 2024.08.05 දින අවසන් වීමට නියමිතය.

02. පොදු කරුණු

2.1 ඒ අනුව තැපෑලෙන් ඡන්දය දීම සඳහා සුදුසුකම් ලබන සියලුම ඡන්දහිමියන් තම තැපැල් ඡන්ද අයදුම්පත තමාගේ කාර්යාලයේ සහතික කිරීමේ නිලධාරී මඟින් අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී වෙත යැවිය යුතුය. මෙම ඡන්ද විමසීමේ තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය වන 2024.08.05 දින මධ්‍යම රාත්‍රී 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් ඡන්දය දීම සඳහා වූ අයදුම්පත් අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී වෙත ලැබී තිබිය යුතු බැවින්, අවසන් දින තෙක් නොසිට කඩිනමින් තැපැල් ඡන්දය අයදුම් කිරීම සඳහා අදාළ නිලධාරීන් දැනුම්වත් කිරීමට කටයුතු කරන ලෙස සහතික කිරීමේ නිලධාරීන්ට උපදෙස් ලබාදෙන මෙන් දන්වා සිටිමි. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට ක්‍රියා කළ යුතු ය. එබැවින් 2024.08.05 දිනයේ මධ්‍යම රාත්‍රී 12.00 දක්වා සියලුම මැතිවරණ කාර්යාල විවෘතව තැබිය යුතු වේ. එමෙන්ම එදිනම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට ලිපි බෙදන දිස්ත්‍රික්කයේ ප්‍රධාන තැපැල් කාර්යාලය වෙත ලැබී ඇති සියලුම ලියාපදිංචි සහ සාමාන්‍ය තැපැල් ඉල්ලුම්පත් භාර ගැනීමට වැඩපිළිවෙලක් දිස්ත්‍රික් තැපැල් අධිකාරී සමඟ සාකච්ඡා කර යොදා ගැනීම සිදුකරන ලෙස ද වැඩිදුරටත් දන්වා සිටිමි.

2.2 තැපෑලෙන් ඡන්දය දීම සඳහා වූ ඉල්ලුම් පත්‍ර නියමිත කාලය ඉකුත් වීමට පෙර සම්පූර්ණ කර ස්වකීය සහතික කිරීමේ නිලධාරීන් මඟින් අදාළ තේරීම්භාර නිලධාරීන් වෙත එවීමට සියලුම තැපැල් ඡන්ද අයදුම්කරුවන් සහ සහතික කිරීමේ නිලධාරීන් කටයුතු කළ යුතු බව දිස්ත්‍රික්කයේ රජයේ කාර්යාල, පාසල්, පොලිස් ස්ථාන, ශ්‍රී ලංගම ඩිපෝ සහ ආරක්ෂක හමුදා කඳවුරු වෙත දැන්වීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව මේ සමඟ අමුණා ඇති සමාංක හා 2024.07.27 දිනැතිව සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/ පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්/ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරු/ ආණ්ඩුකාර ලේකම්වරු/ සභා ලේකම්වරු/ දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ කොමිෂන් සභා ලේකම්වරු/ රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් වෙත යොමු කළ ලිපිය දිස්ත්‍රික්කයේ අවශ්‍යතාව අනුව පිටපත් කොට දිස්ත්‍රික්කය තුළ පිහිටි සියලුම ආයතන වෙත යැවීමට ක්‍රියා කරන ලෙස දන්වා සිටිමි. තව ද තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන්ගේ තොරතුරු හැකි ඉක්මණින් ලබා ගැනීමට කටයුතු කිරීම ද කළ යුතුය.

2.3 තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර දින 02ක කාලය තුළ සහතික කරනු ලබන තැපැල් ඡන්ද අයදුම්පත් තැපැලට යොමු කළහොත් නියමිත දිනට පෙර නොලැබීමට ඉඩ ඇති බැවින්, එම දිනවල දී සහතික කරන ලද තැපැල් ඡන්ද අයදුම්පත් දිස්ත්‍රික් අනුව වෙන්කර තම කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත අතින් ගෙනවිත් භාරදෙන ලෙසට ද සහතික කිරීමේ නිලධාරීන් නොපමාව දැනුම්වත් කිරීම අත්‍යවශ්‍යය.

2.4 දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට අතින් ගෙනවිත් භාරදෙනු ලබන වෙනත් දිස්ත්‍රික්කවලට අදාළ අයදුම්පත්‍ර ප්‍රධාන කාර්යාලයේ දී හුවමාරු කර ගැනීමේ වැඩසටහන පිළිබඳව පසුව දන්වනු ලැබේ.

03. තැපැල් ඡන්ද සඳහා හිමිකම් ඇති අය;

පනතේ 23(2) වගන්තිය අනුව තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීම සඳහා සුදුසුකම් ඇති තැනැත්තන්;

3.1 සේවා නියුක්තියේ විශේෂ කටයුතු හේතු කොට ගෙන නියමිත ඡන්ද පොළේ දී ඡන්දය ප්‍රකාශ කළ නොහැකි වීමට ඉඩ ඇති ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයන්, ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරීන් සහ සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන්;

3.2 සේවා නියුක්තියේ විශේෂ කටයුතු හේතු කොට ගෙන නියමිත ඡන්ද පොළේ දී ඡන්දය ප්‍රකාශ කළ නොහැකි වීමට ඉඩ ඇති බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා සේවකයින්:

3.3 සේවා නියුක්තියේ විශේෂ කටයුතු හේතු කොට ගෙන නියමිත ඡන්ද පොළේ දී ඡන්දය ප්‍රකාශ කළ නොහැකි වීමට ඉඩ ඇති දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා සේවකයින්;

3.4 සේවා නියුක්තියේ විශේෂ කටයුතු හේතු කොට ගෙන නියමිත ඡන්ද පොළේ දී ඡන්දය ප්‍රකාශ කළ නොහැකි වීමට ඉඩ ඇති තැපැල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා සේවකයින්;

3.5 සේවා නියුක්තියේ විශේෂ කටයුතු හේතු කොට ගෙන නියමිත ඡන්ද පොළේ දී ඡන්දය ප්‍රකාශ කළ නොහැකි වීමට ඉඩ ඇති විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා සේවකයින්;

3.6 සේවා නියුක්තියේ විශේෂ කටයුතු හේතු කොට ගෙන නියමිත ඡන්ද පොළේ දී ඡන්දය ප්‍රකාශ කළ නොහැකි වීමට ඉඩ ඇති මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ නිලධාරීන් හා සේවකයින්;

3.7 වෙනත් යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක අපේක්ෂකත්වය නිසා තමාට වෙන් කරන ලද ඡන්ද පොළේ දී ඡන්දය දීමට ඉඩක් නොලබන අපේක්ෂකයින්;

3.8 ඡන්ද විමසීම් දිනයේ දී ඡන්ද විමසීම් හා සම්බන්ධ කාර්යයන් සඳහා නියුක්ත කිරීමට අපේක්ෂිත පළාත් පාලන, පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සේවයේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් හා සේවකයින්;

3.9 ඡන්ද විමසීම් කටයුතු සඳහා යොදවා ගැනීමට අපේක්ෂිත රජයේ පාසල්වල විදුහල්පතිවරුන් හා ගුරුභවතුන්;

3.10 මීට අමතරව ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් කැටුව යන සහයකවරු ලෙස කටයුතු කරන රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයින් වේ. (උදා:- කාර්යාල කාර්ය සහයක, මැනුම් සහයක, පාසැල් කම්කරුට ද තැපැල් ඡන්ද පහසුකම් ලබාදීමට තීරණය කොට ඇත) .

04. තවද ඉහත සඳහන් ආයතනවල නිලධාරීන්ට පරිබාහිරව 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 118 වන වගන්තිය යටතේ මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මතු සඳහන් අත්‍යාවශ්‍ය සේවා සපයන ආයතනවල ඡන්ද විමසීම් දිනයේ රාජකාරීවල නියුක්ත කරවීමට අපේක්ෂිත නිලධාරීන්ට පමණක් තැපෑලෙන් ඡන්ද ප්‍රකාශ කිරීමේ හිමිකම් ලබාදීමට තීරණය කොට ඇත. මේ පිළිබඳව එම ආයතනවල ප්‍රධානීන්/ ප්‍රාදේශීය ප්‍රධානීන් පූර්ණ අවධානය යොමු කර ඡන්ද විමසීම් දිනයේ දී පෙ.ව. 7.00 - ප.ව. 4.00 දක්වා කාලය තුළ තමාට වෙන් කරන ලද ඡන්ද පොළට ගොස් ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි දුරින් ස්වකීය ඡන්ද පොළ පිහිටා ඇති සහ ඡන්ද විමසීම් දින අත්‍යාවශ්‍ය රාජකාරීවල අනිවාර්යයෙන්ම සේවයේ නියුක්ත කරවීමට අපේක්ෂිත නිලධාරීන්ට පමණක් මෙම හිමිකම ලබාදෙනු ලබයි. එහෙයින් ඡන්ද විමසීම් දින ඔවුන් සේවයේ යොදවා ගන්නා බවට එකී ආයතන ප්‍රධානීන් නිසැක විය යුතු අතර අදාළ නිලධාරීන්ගේ අයදුම්පත්‍ර පිළිබඳව පෞද්ගලික අවධානය යොමු කොට ක්‍රියාකරන ලෙස හා එකී අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍ර ආවරණ ලිපියක් සහිතව දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත යොමු කරන ලෙස එම ආයතන ප්‍රධානීන්ට දන්වා යවා ඇති අතර ඔබ දිස්ත්‍රික්කයේ පිහිටි එකී ආයතනවල ප්‍රාදේශීය කාර්යාල ප්‍රධානීන්ට ද ඒ බව දන්වා යැවිය යුතු වේ.

4.1 ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මහවැලි ආරක්ෂක බලකාය මගින් පැය 24 පුරා ආවරණය වන සේ ආරක්ෂාව සපයනු ලබන වික්ටෝරියා ජලාශය, කලා වැව, උඩවලව ජලාශය, බෝවතැන්න ජලාශය, මාදුරුඔය ජලාශය, උල්හිටිය/ රත්කිඳ ජලාශය, කළුගඟ ජලාශය, දඹුලුඔය, කණ්ඩලම, මොරගහකන්ද ජලාශය, උමාඔය, බදුළුඔය ජල පැන්නුම ජලාශ/ වේලි හා ස්ථානයන් හි රාජකාරි සඳහා යොදවනු ලබන සේවකයින්:

4.2 ලංකා විදුලිබල මණ්ඩලය විසින් පැය 24 පුරා අඛණ්ඩව පවත්වාගෙන යායුතු කොළඹ නගරයේ ආර්ථික මධ්‍යස්ථාන වන වරාය හා ප්‍රභූ නිල නිවාස, ප්‍රධාන රාජ්‍ය ආයතන, ප්‍රධාන මාධ්‍ය ආයතන වන රූපවාහිනි සංස්ථාව, ගුවන් විදුලි සංස්ථාව හා ඡන්ද විමසීම හා ගණන් ගැනීම සිදු කරනු ලබන මධ්‍යස්ථානවල සේවා සැපයිය යුතු බැවින්, එම අත්‍යවශ්‍ය සේවාව ඉටුකරන ලංකා විදුලිබල මණ්ඩලයේ බලාගාර, හුවමාරු හා නඩත්තු මධ්‍යස්ථාන සේවකයින්;

4.3 මාර්ග සංවර්ධන අධිකාරියේ පැය 24 පුරා අඛණ්ඩව සේවා පවත්වාගෙන යායුතු අධිවේගී මාර්ග පිවිසුම් හා නඩත්තු අංශයන්හි සේවා නියුක්ත සේවකයින්;

4.4 ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ පැය 24 පුරා අඛණ්ඩව සේවා පවත්වාගෙන යායුතු ඇමතුම් මධ්‍යස්ථානවල සේවය කරන සේවකයින්;

4.5 සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් සමාගමේ ඉන්ධන ගබඩා පිහිටි කොලොන්නාව, මුතුරාජවෙල ආරක්ෂක රාජකාරි ඉටුකරන සේවා නියුක්ත සේවකයින්;

4.6 ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ඡන්ද විමසීම් දින විකාශන කටයුතු සඳහා සම්බන්ධ වන සේවකයින්;

4.7 මැතිවරණ රාජකාරි සඳහා යොදා ගැනීමට අපේක්ෂිත පෞද්ගලික වාහනවල රියදුරන්;

05. මැතිවරණ රාජකාරිවලින් නිදහස්කර ඇති නිලධරයන්

5.1 කැබිනට් සහ රාජ්‍ය අමාත්‍යාංශවල ලේකම්වරුන් හෝ ඒ හා සමාන තනතුරු දරන නිලධරයන්

5.2 ඡන්ද විමසීම් රාජකාරි සඳහා දුර බැහැර ගමන් කිරීමට අපහසු හෝ ඡන්ද විමසීම් රාජකාරී ඉටු කිරීමට අපහසු තරම් ආබාධිත තත්ත්වයෙන් පසුවන නිලධරයන්

5.3 මෙම චක්‍රලේඛය නිකුත්වන දින සිට මාස 06ක කාලය තුළ රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීමට නියමිත නිලධරයන්

5.4 බෞද්ධ භික්ෂූන් වහන්සේලා හා වෙනත් ආගමික පූජකවරුන්

5.5 ගර්භනී අවස්ථාවේ පසුවන නිලධාරිනියන් හා මව්කිරි ලබාදෙන ළදරුවන් සිටින නිලධාරිනියන් හා මැතිවරණ රාජකාරිවල යෙදවීමට නොහැකි තරම් බරපතල අසනීප තත්ත්වයේ පසුවන නිලධරයන්

ඉහත කාණ්ඩවල නිලධරයන් හා යම්කිසි පිළිගත හැකි හේතුවක් නිසා මැතිවරණ රාජකාරිවලින් නිදහස්කර ඇති නිලධරයන් තැපැල් ඡන්ද ඉල්ලුම් නොකරන ලෙස හා සහතික කිරීමේ නිලධාරීන් විසින් එම තැපැල් ඡන්ද ඉල්ලුම්පත් සහතික කිරීම නොකරන ලෙස දන්වා ඇත.

06. ඡන්දහිමි නාමලේඛන ප්‍රදර්ශනය කිරීම සහ අයදුම් කිරීම

තැපැල් ඡන්ද දායකයන්ගේ පහසුව සඳහා මැතිවරණයට වලංගු ඡන්දහිමි නාමලේඛනය වන 2024(1)CR (2024 ඒකාබද්ධ නාමලේඛනය) 2024.07.29 දින සිට පහත සඳහන් ස්ථානවල ප්‍රදර්ශනය කිරීමට කටයුතු යෙදිය යුතු අතර තැපැල් ඡන්ද අයදුම්පත්‍ර ද එකී ස්ථානවල තැබිය යුතු වේ.

6.1 සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල (කච්චේරිවල)

6.2 සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල
6.3 සියලුම ග්‍රාම නිලධාරි කාර්යාලවල } අදාළ බල ප්‍රදේශයට අයත් වන ඡන්දහිමි නාමලේඛන

ඉහත සඳහන් ස්ථානවලට අමතරව,

6.4 රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරශ්‍රය කොළඹ 07

6.5 කම්කරු දෙපාර්තමේන්තුව, කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට, කොළඹ 05.

6.6 අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.

6.7 රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, 243/3/ඒ, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තමුල්ල.

6.8 තැපැල් මූලස්ථානය, ඩී.ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.

6.9 ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, මාලිගාවත්ත.

6.10 සෙත්සිරිපාය පළමු අදියර කාර්යාල සංකීර්ණය, බත්තරමුල්ල යන ස්ථානයේ, කොළඹ දිස්ත්‍රික්කයේ රජයේ කාර්යාල සංකීර්ණවල ඡන්දහිමි නාමලේඛන තොරතුරු පරිගණක ආශ්‍රයෙන් අයදුම්කරුවන් වෙත ලබාදීමට කටයුතු කරනු ඇත.

07. තැපැල් ඡන්ද අයදුම් කිරීම

7.1 මෙම ජනාධිපතිවරණයේ දී තැපැල් ඡන්ද අයදුම්පත් භාරගැනීම මතු දැක්වෙන ප්‍රධාන ආකාර මඟින් සිදු කිරීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කොට ඇත. පහත අංක 7.2.1, 7.2.2 හා 7.2.3 සඳහා සවිස්තරාත්මක මඟ පෙන්වීමේ උපදෙස් මේ සමඟ අමුණා ඇත. (PRE/2024/09/A)

7.1.1 ස්වයං මාර්ගගත අයදුම් කිරීම **(Self – Online Applying).**

මෙහිදී තැපැල් ඡන්ද අයදුම්කරුම තමාගේ තොරතුරු සහ නියමිත සහතික කිරීමේ නිලධාරියාගේ තොරතුරු මැතිවරණ ඉ - සේවාව (https://eservices.elections.gov.lk) ඔස්සේ ඇතුළත් කොට අයදුම් කිරීමට අවස්ථාව ලබාදේ. එසේ මාර්ගගතව මැතිවරණ ඉ - සේවාව තුළින් සම්පූර්ණ කොට බාගත කර ගන්නා අයදුම්පතේ මුද්‍රිත පිටපත් (අයදුම්කරුගේ සහ සහතික කිරීමේ නිලධාරීගේ තොරතුරු ද ඇතුළත්) සහතික කිරීමේ නිලධාරී විසින් සහතික කොට අදාළ මැතිවරණ කාර්යාලය වෙත යොමු කළ යුතු වේ. මේ ක්‍රමවේදය සඳහා අයදුම්කරු විසින් ඉ - සේවාව ගිණුමක් (User Account) සකස් කර ගත යුතුය.

7.1.2 ආයතනික මාර්ගගත අයදුම් කිරීම **(Certifying Officer Online Applying)**

ආයතනයේ තැපැල් ඡන්ද අයදුම්කරන සියලු නිලධාරීන්ගේ තොරතුරු (සහතික කිරීමේ නිලධාරියාගේ ද තොරතුරු සහිතව) සහතික කිරීමේ නිලධාරී හෝ සහතික කිරීමේ නිලධාරීගේ සහායකයෙකු විසින් මැතිවරණ ඉ- සේවාව මඟින් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව අදාළ අයදුම්පත් සියල්ල බාගත කොට සහතික කර අදාළ මැතිවරණ කාර්යාලය වෙත යොමු කිරීම සිදු කළ යුතුය. මෙය ආයතනයේ සහතික කිරීමේ නිලධාරියාට අදාළ ඉ - සේවාව ගිණුම මඟින් සිදු කළ යුතු වේ.

7.1.3 දත්ත මුද්‍රණය කර ගැනීමේ ක්‍රමය (අර්ධ මාර්ගගත ක්‍රමය)
**(Semi online data Printing Applying)**

ඉහත 7.1.1 හෝ 7.1.2 ක්‍රම භාවිතා කිරීමට නොහැකි වන අවස්ථාවලදී මැතිවරණ ඊ සේවාව මඟින් තැපැල් ඡන්ද අයදුම්කරුගේ හැඳුනුම්පත් අංකය පමණක් ඇතුළත් කොට අයදුම්කරු විසින්ම මාර්ගගතව අයදුම්පත සකසා ගැනීම කළ හැකි වේ.

අයදුම්කරු විසින් මාර්ගගතව සකසා මුද්‍රණය කරගත් අයදුම්පත සහතික කිරීමේ නිලධාරී වෙත ලබාදුන් පසු සහතික කිරීමේ නිලධාරී විසින් සහතික කිරීමේ නිලධාරීගේ තොරුතුරු ද සම්පූර්ණ කොට සහතික කිරීමෙන් අනතුරුව අදාළ මැතිවරණ කාර්යාලය වෙත යොමු කිරීම කළ යුතු වේ.

7.2 නිල වෙබ් අඩවිය හරහා අයදුම්පත ලබා ගැනීම

මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියට (https://elections.gov.lk) පිවිස එහි ඇති තැපැල් ඡන්ද අයදුම් කිරීමේ අයදුම්පත්‍රය බාගත කොට මුද්‍රණය කර අයදුම්කරුට අදාළ තොරතුරු සම්පූර්ණ කිරීමෙන් අනතුරුව සහතික කිරීමේ නිලධාරියා විසින් ස්වකීය තොරතුරු ඇතුළත් කොට අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත එවිය යුතු වේ.

7.3 මුද්‍රිත අයදුම්පත ලබා ගැනීම (සාමාන්‍ය ක්‍රමවේදය)

මැතිවරණ කොමිෂන් සභාව මගින් නිකුත් කරනු ලබන මුද්‍රිත අයදුම්පතක් පුරවා සහතික කිරීමේ නිලධාරී මගින් මැතිවරණ කාර්යාලය වෙත එවීම.

7.4 ජාතික හැඳුනුම්පත් අංකය ඡන්දහිමි නාමලේඛනයේ සටහන්ව නොමැති අයදුම්කරුවන්ට ඡන්දහිමි නාමලේඛන පොත් වශයෙන් ප්‍රදර්ශනය කරනු ලබන ඉහත 06 ඡේදයෙහි සඳහන් ස්ථානයකින් තොරතුරු ලබා ගැනීමට සිදු වේ.

7.5 එක හා සමාන පුද්ගල නාම පවතින හෙයින් තමන්ගේ තොරතුරු වෙනත් අයකු ලවා පරීක්ෂා කොට තැපැල් ඡන්ද අයදුම්පත් සම්පූර්ණ කිරීමෙන් වලකින ලෙස තැපැල් ඡන්ද අයදුම්කරුවන්ට දැනුම් දීමට කටයුතු කළ යුතුය.

## 08. සහතික කිරීමේ නිලධාරීන්

8.1 මැතිවරණ කොමිෂන් සභාව විසින් නාමයෝජනා දැන්වීම ප්‍රසිද්ධ කළ වහාම තැපැල් ඡන්ද අයදුම් කිරීමේ අවස්ථාව සැලසෙන බැවින්, දිස්ත්‍රික්කය තුළ පිහිටි සියලු මධ්‍යම රජයේ හා පළාත් රාජ්‍ය සේවයේ කාර්යාල, පොලිස් ස්ථාන සහ ඒකක, ශ්‍රී ලංගම ඩිපෝ සහ ආරක්ෂක හමුදා කඳවුරු වෙත, තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් පත්කර එවන ලෙස හා තැපැල් ඡන්ද අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබා ඇති සියලු දෙනා ඒ සම්බන්ධයෙන් දැනුම්වත් කරන ලෙසට ලිඛිත උපදෙස් ලබාදීමට ක්‍රියා කිරීම කළ යුතු වේ. මැතිවරණ රාජකාරි සඳහා ගුරු භවතුන් යොදා ගැනීමට නියමිත සියලුම පාසල්වල විදුහල්පතිවරුන් වෙත තෝරා ගැනීමට අපේක්ෂිත විදුහල්පති ශ්‍රේණියේ, ගුරු සේවයේ හෝ පිරිවෙන් ගුරු සේවයේ ගිහි ගුරුවරුන්ගේ තොරතුරු දන්වා එම කාණ්ඩවලට අදාළ ගුරුභවතුන්ට තැපැල් ඡන්ද ඉල්ලුම් කරන ලෙසට හා සහතික කිරීමේ නිලධාරීන්ගේ විස්තර කලාප අධ්‍යාපන කාර්යාලය විමසා ලබාගන්නා ලෙසට උපදෙස් යැවිය යුතු අතර, ගුරුභවතුන්ගේ තැපැල් ඡන්ද සහතික කරනු ලබන අධ්‍යාපන පරිපාලන සේවයේ විදුහල්පතිවරුන්, මහා විද්‍යාලවල සේවයේ නියුතු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 පන්තියේ විදුහල්පතිවරුන් හා කලාප අධ්‍යාපන කාර්යාලයෙන් ඒ සඳහා පත් කරනු ලබන සහතික කිරීමේ නිලධාරීන්ගේ විස්තර අදාළ විදුහල්වලට යැවීම සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට වහාම ගෙන්වා ගැනීමට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත ද දැනුම් දීමට කටයුතු කළ යුතුය. මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද **"ඡන්ද විමසීම්වලදී තැපෑලෙන් ඡන්දය දීමේ ක්‍රියා පිළිවෙල පිළිබඳ ආයතන ප්‍රධානීන්ට සහ සහතික කිරීමේ නිලධාරීන්ට මඟ පෙන්වීමේ උපදෙස්"** පොත් පිංච ද අදාළ සියලුම ආයතන වෙත යැවීමට කටයුතු කළ යුතු ය.

## 09. තැපැල් ඡන්ද අයදුම්පත් සහතික කිරීම

9.1 පනතේ 23(2) වගන්තිය අනුව මෙම ඡන්ද විමසීම සඳහා තැපැල් ඡන්ද පහසුකම් සැලසිය යුත්තේ මැතිවරණ රාජකාරි පැවරීමට ඉඩ ඇතැයි සලකන රාජ්‍ය නිලධාරීන්, අත්‍යාවශ්‍ය සේවාවන් හි නියුතු නිලධාරීන්, සේවකයන් සහ ත්‍රිවිධ හමුදා, පොලිස් හා සිවිල් ආරක්ෂක බලකාය යටතේ දිවයිනේ සියලු ප්‍රදේශවල ආරක්ෂන කටයුතුවල නිරත පුද්ගලයින්ගේ සහ ඉහත 04 ඡේදය යටතේ දක්වා ඇති ආයතනවල අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ඒ ඒ කාර්යාලවල සහතික කිරීමේ නිලධාරීන් විසින් සහතික කළ පසුව වේ.

9.2 තෝරා පත්කර ගැනීමක අපේක්ෂකත්වය නිසා තමාට වෙන් කරන ලද ඡන්ද පොළේ දී ඡන්දය ප්‍රකාශ කිරීමට ඉඩ නොලබන අපේක්ෂකයින්ගේ තැපැල් ඡන්ද අයදුම්පත්‍ර සහතික කිරීම අදාළ අපේක්ෂකයා ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි වී ඇති දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධාරි විසින් සිදු කළ යුතු ය.

9.3 ඉහත 3.10 හි සඳහන් සහයකයින් තැපැල් ඡන්ද ඉල්ලුම් කිරීමේ දී තමා කැටුව යැමට අපේක්ෂා කරන ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ ලිඛිත නිර්දේශයක් තැපැල් ඡන්ද අයදුම්පතට අමුණා තිබිය යුතු වේ.

9.4 සහයකයින් වශයෙන් යැමට අපේක්ෂිත රාජ්‍ය සේවයේ නියුතු තැනැත්තන් පිළිබඳව සහතික කිරීමේ නිලධාරී ලෙස එම කාර්යාලයේ තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරී ක්‍රියා කළ යුතු අතර, පෞද්ගලික සහයකයින්ගේ තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරී ලෙස දිස්ත්‍රික් නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්/ සහකාර මැතිවරණ කෙමසාරිස් ක්‍රියා කළ යුතු වේ.

9.5 තමා විසින් නිර්දේශ කරන කණිෂ්ඨ සේවකයා/ පෞද්ගලික සේවකයා අනිවාර්යයෙන්ම ඡන්ද පොළ රාජකාරි සඳහා රැගෙන යාමට කටයුතු කරන ලෙස ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් වෙනුවෙන් පවත්වනු ලබන උපදෙස් සැසිවලදී දැනුම්වත් කිරීම කළ යුතු ය.

9.6 ඡන්ද විමසීම පැවැත්වෙන දිනයේ දී ඡන්ද පෙට්ටි ප්‍රවාහනය කිරීමට යොදා ගනු ලබන පෞද්ගලික බස් රථ හා රිය සහායකයින් පූර්වයෙන් හඳුනාගත යුතු අතර, ඔවුන්ගේ තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරී ලෙස දිස්ත්‍රික් නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්/ සහකාර මැතිවරණ කොමසාරිස් ක්‍රියා කළ යුතු වේ.

## 10. තැපැල් ඡන්ද අයදුම්පත් සම්බන්ධයෙන් කටයුතු කිරීම

10.1 ලැබී ඇති අයදුම්පත් 2024 වර්ෂයේ 2024(1)CR ඡන්දහිමි නාමලේඛනයට අනුව පරීක්ෂා කළ යුතු අතර, පහත අංක 10 හි සඳහන් සියලු කරුණු සපුරා ඇත්නම් එබඳු අයදුම්පත් පිළිගත යුතු ය. මෙම ඡන්ද විමසීම් රාජකාරි සඳහා යොදා ගත යුතු නිලධාරී සංඛ්‍යාව අධික විය හැකි අතර, තැපැල් ඡන්ද අයදුම්පත් ප්‍රතික්ෂෙප වීම සමග ඔවුන් රාජකාරි සඳහා නොපැමිණීමේ තත්ත්වයක් උද්ගත වුවහොත් ගැටලු ඇති විය හැකිය. එම තත්ත්වය වළක්වා ගැනීම් වස් අතපසු වීම්, ලිවීමේ අඩුපාඩු වැනි සුළු අඩුපාඩුකම් මත අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමෙන් වළකින ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

10.2 තැපැල් ඡන්ද අයදුම්පත් ඉතා සැලකිල්ලෙන් පරීක්ෂා කළ යුතු අතර, අයදුම්පතෙහි අඩුපාඩු කිසිවක් ඔබ හෝ ඔබගේ නිලධාරීන් විසින් සම්පූර්ණ නොකළ යුතු ය. එබඳු අයදුම්පත් ප්‍රතික්ෂේප කර ඒ පිළිබඳව ප්‍රතික්ෂේප කිරීමට හේතුව ද සමඟ වහාම අදාළ සහතික කිරීමේ නිලධාරී මඟින් අයදුම්කරු වෙත දන්වා යැවිය යුතු ය. ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව ලිඛිතව දන්වා යැවීමේ දී ප්‍රමාද වීම් ඇතිවීම වැළැක්වීම් වස් අයදුම්පතේ අඩුපාඩු සම්බන්ධව අදාළ අයදුම්කරු වෙත හෝ සහතික කිරීමේ නිලධාරී වෙත දුරකථනයෙන් දන්වා අඩුපාඩු සඳහන් කිරීම සහ නව අයදුම්පත්‍රයක් ගෙන්වා ගැනීම වඩාත් කාලෝචිත වේ.

10.3 අයදුම්පත් භාර ගැනීම අවසන් වූ වහාම මේ සමඟ යාකර ඇති අංක **PRE/2024/F1** දරන ආකෘතිය මඟින් ලැබුණු තැපැල් ඡන්ද අයදුම්පත් සංඛ්‍යාව හා එයින් කොපමණ සංඛ්‍යාවක් අනුමත කරනු ලැබුවේ ද, කොපමණ සංඛ්‍යාවක් ප්‍රතික්ෂේප කරනු ලැබුවේ ද යන්න සඳහන් කර ප්‍රධාන කාර්යාලයට එවිය යුතු වේ. (ෆැක්ස් 011-2868169, ඉ - තැපැල dc.ne@elections.gov.lk)

10.4 තැපැල් ඡන්ද නාමලේඛනය සහතික කිරීමෙන් අනතුරුව සියලුම තොරතුරු ඇතුළත් ආකෘතිය **(PRE/2024/F2)** ඉහත ෆැක්ස් හා ඉ - තැපැල වෙත යොමු කිරීමට කටයුතු කළ යුතු වේ.

## 11. අයදුම්පත් පරීක්ෂාවේ දී සැලකිල්ලට ගත යුතු කරුණු

11.1 අයදුම්පතෙහි දැක්වෙන තොරතුරු (මැතිවරණ කොට්ඨාසය හා අංකය, අයදුම්කරුගේ ඡන්ද ප්‍රදේශ අක්ෂරය හා නම, ඡන්ද කොට්ඨාසයේ අංකය, නම සහ පිළිවෙළ අංකය) පරිගණක දත්ත සමග පරීක්ෂා කළ යුතු ය. (ඇතැම්විට 2024 ප්‍රධාන නාමලේඛනයේ තොරතුරු හෝ 2024 පළමු පරිපූරක නාමලේඛනයට අදාළ තොරතුරු ආශ්‍රයෙන් අයදුම්පත් සම්පූර්ණ කර තිබිය හැකි බැවින් ඒ සම්බන්ධව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු වේ)

11.2 අයදුම්පතෙහි පළමුව ඡන්දහිමියා විසින් තමාගේ නම වශයෙන් සඳහන් කර ඇති නම සහ දෙවනුව සඳහන් කර ඇති නාමලේඛනයේ සඳහන් පරිදි නම එකිනෙක හා සමග ගැලපීමේ දී එම නම් දෙකින්ම හැඳින්වෙන්නේ එකම පුද්ගලයා බව තහවුරු විය යුතු ය. එකම පුද්ගලයකු නොවේ යැයි සුළු හෝ සැකයක් මතු වුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කළ යුතු ය. එවැනි අවස්ථා පිළිබඳව දිස්ත්‍රික් කාර්යාලයේ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්/ සහකාර මැතිවරණ කොමසාරිස් හෝ තැපැල් ඡන්ද කටයුතු විෂයභාර මාණ්ඩලික නිලධාරී පුද්ගලිකව පරීක්ෂා කර තීරණ ගැනීමට කටයුතු කළ යුතු ය.

11.3 අයදුම්කරු ඡන්ද විමසීම පැවැත්වෙන දිස්ත්‍රික්කයේ මැතිවරණ රාජකාරි පැවරෙන අයෙකු, නැතහොත් අත්‍යවශ්‍ය සේවාවක හෝ ආරක්ෂක සේවයේ නිරතවන අයෙකු, ග්‍රාම නිලධාරීවරකු, අපේක්ෂකයෙකු, දුම්රිය දෙපාර්තමේන්තුවේ, තැපැල් දෙපාර්තමේන්තුවේ, විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ නිලධරයකු හෝ සේවකයෙකු හෝ ඉහත 04 ඡේදයේ සඳහන් ආයතනයක හෝ සේවකයෙකු විය යුතු ය. ඊට පරිබාහිර පුද්ගලයින් විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කළ යුතු ය.

11.4 අයදුම්කරු විසින් අදාළ අයදුම්පතෙහි නියමිත පරිදි අත්සන් කර තිබිය යුතු ය.

11.5 සහතික කිරීමේ නිලධාරී විසින් විධිමත් පරිදි සහතික කර අත්සන් තබා ඔහුගේ/ ඇයගේ නිල මුද්‍රාව ද අයදුම්පතෙහි නියමිත ස්ථානයේ තැබිය යුතු බවත් අවධාරණය කිරීම අත්‍යවශ්‍ය ය.

11.6 කිසියම් තැපැල් ඡන්ද අයදුම්පතක ඡන්ද කොට්ඨාස අංකය හා නම, අනු අංකය හෝ ඡන්ද දායකයාගේ නම කපා හැර සංශෝධනය කර ඇති නම් එබඳු අයදුම්පත් අනුමත කිරීමට පෙර තවදුරටත් පරීක්ෂා කිරීම සුදුසු ය. ඡන්දහිමියා විසින් දෙන ලද තොරතුරු වෙනත් පුද්ගලයකු විසින් ව්‍යාජ ලෙස වෙනස් කර තිබිය හැකි ය. කෙසේ වෙතත් එබඳු අයදුම්පතක් සහතික කිරීමේ දී සහතික කිරීමේ නිලධාරී පෞද්ගලිකවම සෑහීමකට පත්විය යුතු බවත් සංශෝධන කරන ලද සෑම ස්ථානයකම සහතික කිරීමේ නිලධාරී විසින් අත්සන් තැබිය යුතු බවත් අවධාරණය කිරීම අත්‍යවශ්‍ය ය.

11.7. අයදුම්පතේ දකුණ පස ඉහළ කෙලවරේ සහතික කිරීමේ නිලධාරියාගේ කේත අංකය ද අනිවාර්යයෙන් සඳහන් කර තිබිය යුතු අතර එය සඳහන් කොට නොමැති නම් සහතික කිරීමේ නිලධාරී වෙත දන්වා එම කේත අංකය ඇතුළත් කර ගත යුතු ය.

11.8 අයදුම්පත් පරීක්ෂාවෙන් පසු ප්‍රතික්ෂේප කිරීමට නිර්දේශ කරනු ලබන සියලුම තැපැල් ඡන්ද අයදුම්පත් සම්බන්ධයෙන් පෞද්ගලිකවම නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරයා විසින් පරීක්ෂා කර තීරණ ගත යුතු ය.

11.9 තැපැල් ඡන්ද පැකට්ටුව යැවිය යුතු වශයෙන් සහතික කිරීමේ නිලධාරීගේ නම, තනතුර සහ රාජකාරි ලිපිනය පැහැදිලිව සඳහන් කර තිබිය යුතු ය.

11.10 මැතිවරණ රාජකාරිවල නියුක්ත කරවීමේ හා දෛනික අත්‍යවශ්‍ය සේවා අඩාලවීමකින් තොරව පවත්වාගෙන යාම පිණිස තැපැල් ඡන්ද හිමිකම ලබා දීම සිදුකරන බැවින් ඉල්ලුම්පත්වල පවත්නා සුළු සුළු අඩුපාඩුකම් හෝ බැලූ බැල්මට අතපසුවීම් යැයි හැඟෙන කරුණු මත අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමෙන් වළකින ලෙස ඉල්ලා සිටිනු ලැබේ. තැපැල් ඡන්ද අයදුම්පත්වල ඉල්ලුම්කරුගේ/ කාර්යාලයේ දුරකථන අංකය සඳහන් කොට ඇති බැවින් එවැනි අඩුපාඩු සම්බන්ධයෙන් දුරකථන අංකය සඳහන් කොට ඇති බැවින් එවැනි අඩුපාඩු සම්බන්ධයෙන් දුරකථන ඇමතුමක් ලබා දී නිවැරදි කර ගැනීම වඩාත් යෝග්‍ය බැව් දන්වනු කැමැත්තෙමි.

**සටහන :- (මෙම සියලු කරුණු සම්බන්ධයෙන්, තැපැල් ඡන්ද කටයුතු ආරම්භ කිරීමට පෙර සියළුම ඡන්ද ප්‍රදේශභාර නිලධාරීන් සහ මෙම කාර්යය සඳහා සහභාගී කර ගන්නා වෙනත් කාර්යාලවල මාණ්ඩලික නිලධාරීන් සහ අනෙකුත් නිලධාරීන් ද දැනුම්වත් කිරීම හා අවශ්‍ය උපදෙස් ලබාදීම කළ යුතු ය.**

**12.** තැපැල් ඡන්ද දායකයන් පිළිබඳ ලැයිස්තුව පරිගණක ගත කිරීම.

12.1 සියලුම අයදුම්පත් විස්තර තැපැල් ඡන්ද සඳහා වන පරිගණක වැඩසටහනට ඇතුළත් කළ යුතු අතර පහත ආකෘතියට අනුරූපීව ලබාගනු ලබන වාර්තාවේ ආකාරයට එමගින් තැපැල් ඡන්ද ලැයිස්තුව මුද්‍රණය කර ගත හැකි වනු ඇත. (වැඩිදුරටත් උපදෙස් අවශ්‍ය නම් තොරතුරු තාක්ෂණ අංශයේ සහකාර අධ්‍යක්ෂ රංජන් නිශාන්ත මහතා දුරකථන අංක 0777133163 මගින් ඇමතීම සුදුසු වේ).

12.2 තැපැල් ඡන්ද දායකයන් පිළිබඳ ලැයිස්තුව සඳහා ආකෘතිය

ජනාධිපතිවරණය - 2024
තැපැල් ඡන්ද දායකයින් පිළිබඳ ලැයිස්තුව

මැතිවරණ කොට්ඨාසය : ..............................

ඡන්ද ප්‍රදේශය : ..............................

| (1) අනු අංකය | (2) වලංගු නාමලේඛනයෙහි දැක්වෙන අයුරු තොරතුරු | | | | (3) ඡන්ද පත්‍රිකාව යැවෙන ලිපිනය (සහතික කිරීමේ නිලධාරී) |
|---|---|---|---|---|---|
| | තැපැල් ඡන්දදායකයාගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය සහ ලිපිනය | ගැ/පි | ඡන්ද කොට්ඨාස අංකය | අනුක්‍රමික අංකය | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

**13.** තැපැල් ඡන්ද අයදුම්පත පිළිගත් බව හෝ නොපිළිගත් බව දැනුම් දීම.

13.1 සෑම තැපැල් ඡන්ද අයදුම්පතක්ම පිළිගත් බව හෝ නොපිළිගත් බව අයදුම්කරුගේ සහතික කිරීමේ නිලධාරීට පිටපතක් සහිතව අදාළ අයදුම්කරු වෙත දන්වා යැවීම සුදුසු ය.

13.2 අවශ්‍ය යැයි ඔබ විසින් තීරණය කරනු ලබන අවස්ථාවන් හි දී අදාළ ලිපියේ පිටපතක් ඡන්ද හිමියාගේ පෞද්ගලික ලිපිනය වෙත ද යැවීම සුදුසු ය.

**14.** තැපැල් ඡන්දදායකයන් පිළිබඳ ලැයිස්තුව සහතික කිරීම හා අනුපිටපත් කිරීම.

14.1 තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුව පිළියෙල කරනු ලැබූ වහාම තේරීම්භාර නිලධාරී විසින් එහි පිටපතක් ප්‍රදර්ශනය සඳහා තම කාර්යාලයේ තැබීමෙන් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය. එසේ ප්‍රකාශයට පත් කළ යුතු දිනය පසුව දන්වනු ලැබේ.

14.2 තේරීම්භාර නිලධාරී විසින් තැපැල් ඡන්ද දායකයන් පිළිබඳ ලැයිස්තුව සහතික කිරීමේ වගන්තිය අදාළ ඡන්ද විමසීම් පනත ප්‍රකාරව අවසාන ඡන්ද කොට්ඨාසයෙහි ඇතුළත් කර අත්සන හා දිනය යෙදිය යුතුය.(තැපැල් ඡන්ද දායකයන්ගේ ලැයිස්තුවල සහතික කළ යුතු දිනය පසුව දන්වා එවනු ලැබේ.

"1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 23(12) වගන්තිය ප්‍රකාරව පිළියෙළ කර දෙවන උපලේඛනයේ සඳහන් තැපැල් ඡන්දදායකයාගේ පිළිබඳ නියෝග මාලාවේ නියෝග 4 යටතේ පළ කරන ලදි

14.3 තැපැල් ඡන්ද දායකයන්ගේ ලැයිස්තුවේ පිටපත් ලබා ගැනීමේ දී තරග කරනු ලබන අපේක්ෂකයින්/ බලයත් නියෝජිතයන් වෙනුවෙන් නොමිලයේ එක් පිටපතක් බැගින් සංයුක්ත තැටි (CD) මගින් ලබා දිය යුතු වේ. තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම, නිල ඡන්ද දැන්වීම්පත් බෙදා හැරීම, ඡන්ද පොළේ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ පිටපත ආදී වශයෙන් අවශ්‍යතා හඳුනාගෙන මුද්‍රණය සඳහා අවශ්‍ය පිටපත් සංඛ්‍යාව තීරණය කළ යුතු ය.

## 15. තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම පිළිබඳ දැන්වීම.

15.1 ජනාධිපතිවරණ පනතේ දෙවන උපලේඛනයේ 10 නියෝගය අනුව සකස් කළ යුතු ය. **(PRE/2024/09/F4)**

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ දෙවැනි උපලේඛනයෙහි 10(1) නියෝගය අනුව නාමයෝජනා අවසන් දිනට පසු දින 10ක් ඉකුත් වීමට පෙර තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කරනු ලබන දිනය, වේලාව, ස්ථානය සහ නිකුත් කිරීමේ දී පැමිණ සිටීමට 8 වැනි නියෝගයේ (2) ඡේදය යටතේ පත්කළ හැකි නියෝජිතයන් සංඛ්‍යාව පිළිබඳව බලය ලත් නියෝජිතයන් වෙත දැනුම් දිය යුතුය. නියෝජිත සංඛ්‍යාව වනුයේ එක් නිකුත් කිරීමේ මධ්‍යස්ථානයකට එක් නියෝජිතයකු බැගින් වන සංඛ්‍යාවකි.

15.2 දැන්වීම පළ කළයුතු දිනය පසුව දන්වනු ලැබේ. එම දැනුම්දීම සමග පනතේ 2 වන උපලේඛනයේ 8 සහ 9 නියෝගවල ඡායා පිටපතක් සහ නියෝජිතයන් පත් කිරීමේ ආකෘති ද යැවිය යුතුය.**(PRE/2024/09/F3)**

## 16. තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම.

16.1 තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ ක්‍රියාවලිය එක් දිනක් තුළ අවසන් කළ හැකි වන පරිදි පිළිගත් තැපැල් ඡන්ද අයදුම්පත් සංඛ්‍යාව අනුව සුදුසු නිකුත් කිරීමේ ස්ථාන හා කණ්ඩායම් සංඛ්‍යාව ඔබ විසින් තීරණය කර ගත යුතු ය.

16.2 එක් නිකුත් කිරීමේ මධ්‍යස්ථානයක් සඳහා තැපැල් ඡන්ද 500-750 අතර ප්‍රමාණයක් වෙන් කිරීම වඩාත් සුදුසු වේ.

16.3. පසුගිය ඡන්ද විමසීම්වල දී තැපැල් ඡන්ද නිකුත් කිරීමේ කටයුතුවල නිරත වී ඇති අත්දැකීම් සහිත කාර්යක්ෂමව හා උනන්දුවෙන් කටයුතු කරන සහකාර තේරීම්භාර නිලධාරීන්ට ප්‍රමුඛතාව ලබාදීම වැදගත් වේ.

16.4. පසුගිය ඡන්ද විමසීම්වල දී නොසැලකිල්ලෙන් කටයුතු කළ සහකාර තේරීම්භාර නිලධාරීන් මෙවර එම තනතුර සඳහා පත් නොකිරීමට සැලකිලිමත් විය යුතුය.

16.5 සෑම කණ්ඩායමක් බාරවම සහකාර තේරීම්භාර නිලධාරිවරයෙකු සිටිය යුතු අතර, ඊට අමතරව රාජ්‍ය කළමණාකරණ සේවයේ, සමාන්තර ශ්‍රේණියේ නිලධාරීන් තිදෙනෙකු හා කාර්යාල කාර්ය සහායකයෙකු පත් කළ යුතු . මෙම කාර්යය සඳහා ඔබ විසින් තනතුරු නාමයෙන් ගැසට් කිරීම සඳහා මා වෙත එවනු ලැබූ සහකාර තේරීම්භාර නිලධාරීන් අතුරෙන් අවශ්‍ය සංඛ්‍යාවක් පත් කළ යුතු ය.

16.6 තැපැල් ඡන්ද නිකුත් කිරීමේ දිනට පෙර තැපැල් ඡන්ද ලැයිස්තුව අනුව අවශ්‍ය A,B,C සහ D කවර සකස් කරගත යුතු ය.

16.7 තැපැල් ඡන්ද නිකුත් කිරීමත් සමග එදිනම එම පැකට්ටු රක්ෂණ තැපැලෙන් යැවීම සඳහා තැපැල් කාර්යලය වෙත භාරදිය යුතු ය. මේ පිළිබඳව දිස්ත්‍රික් තැපැල් අධිකාරී සමග සාකච්ඡා කර පැකට්ටු භාර දීමේ ක්‍රියපිළිවෙල කල්වේලා ඇතිව සංවිධානය කර ගත යුතු ය.

16.8 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හෝ වෙනත් පරිශ්‍රයක ස්ථාන කිහිපයක දී ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ කටයුතු සිදු කිරීමට සිදුවන බැවින්, කොට්ඨාශ භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සමඟ සාකච්ඡා කොට එම අවස්ථාවට උචිත වන පරිදි විශේෂ පොලිස් ආරක්ෂවක් ලබාගත ගත යුතු අතර ඡන්ද පැකට්ටු රැගෙන යන වාහන සහ භාරගනු ලබන ස්ථාන සඳහා ආරක්ෂක පියවර යෙදිය යුතු වේ.

16.9 ඒ ඒ නිකුත් කිරීමේ ස්ථානයට අවශ්‍ය A කවර, B කවර, C කවර, D කවර,ස්ටිකර්, ගම්, ක්ලිප්ස්, අනන්‍යතා ප්‍රකාශ, රහස්‍ය මුද්‍රා, තැපැල් ඡන්ද ලැයිස්තුව, නියෝජිත ලැයිස්තුව, අඩිරූල්, පැන්සල් ආදී අවශ්‍ය සියළුම දෑ කල්තබා තෝරා වෙන්කර සූදානම් කළ යුතු ය. A, C, D කවර කල්තබා සකස් කරගත යුතු වේ.

16.10 එක් එක් නිකුත් කිරීමේ කණ්ඩායමක් සඳහා ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ දී විශේෂයෙන් සැලකිලිමත් විය යුතු වේ.

16.11 තැපැල් ඡන්ද නිකුත් කිරීමේ දී එම කටයුතු නිරීක්ෂණය සඳහා පැමිණෙන බලයලත් නියෝජිතයකු/ බලයලත් නියෝජිතයකු විසින් තමා වෙනුවට පැමිණ සිටීමට පත් කරනු ලැබූ තැනැත්තෙකු හා මැතිවරණ කොමිෂන් සභාව අවසර දෙනු ලැබූ මැතිවරණ නිරීක්ෂණ සංවිධාන විසින් නම් කරන ලද නිරීක්ෂකයන්ගේ පැමිණීම සටහන්කර ගැනීම, රහස්‍යතා ප්‍රකාශ ලබා ගැනීම හා අදාළ නිකුත් කිරීමේ මධ්‍යස්ථාන වෙත යොමු කිරීම භාරව සහකාර තේරීම්භාර නිලධරයෙක් පත් කිරීම කළ යුතු ය.

16.12 තැපැල් ඡන්ද නිකුත් කරන දිනයේ දී ම ආපසු ලැබෙන සලකුනු කරන ලද "A" කවර බහාලීම සඳහා හිස් තැපැල් ඡන්ද පෙට්ටි නියෝජිතයන්ට පෙන්වා ඔවුන් ඉදිරිපිට දී මුද්‍රා තැබීම අත්‍යවශ්‍ය ය.

**17. තැපැල් ඡන්ද නිකුත් කිරීම් කටයුතු සම්බන්ධව පහත සඳහන් කරුණු අදාළ කණ්ඩායම් භාර සහකාර තේරීම්භාර නිලධාරීන්ට දැනුම්දිය යුතු ය.**

17.1 එක් එක් නිකුත් කිරීමේ මධ්‍යස්ථානයට පත් කොට ඇති බලයලත් නියෝජිතයින්ට/ ඔවුන් විසින් පත් කරනු ලැබූ තැනැත්තන්ට දැනුම් දී ඇති වේලාව ඉක්ම වූ වහාම නිකුත් කිරීමේ කටයුතු ඇරඹිය හැකි බව හා ඊට පෙර පැමිණ සිටින නියෝජිතයින්ගේ පත්වීම් ලිපි පරීක්ෂා කර පැමිණීම සටහන් කරගත යුතු බව ;

17.2 සහකාර තේරීම්භාර නිලධාරී විසින් කාර්ය මණ්ඩලයෙන් සහ නියෝජිතයින්ගෙන් "ඇ " ආකෘතියෙහි වූ රහස්‍යතා ප්‍රකාශය ලබා ගත යුතු බව;

17.3 නිකුත් කිරීමේ මධ්‍යස්ථානයට අවශ්‍ය ඉහත ඡේදයේ සඳහන් සියලුම දෑ කල් තබා සූදානම් කර ඇති බවට නිසැක වීම;

17.4 ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම නිරීක්ෂනය කිරීමට පැමිණෙන නියෝජිතයින්ට ඒ සඳහා අවස්ථාව සැලසීම අවශ්‍ය බව;

17.5 ඡන්ද පොළේ දි මෙන්ම මෙහි දී ද ඡන්ද දායකයාගේ අනු අංකය සහ ශබ්ද නගා කියවිය යුතු බව; අවධාරණය කළ යුතු ය.

මෙහි දී අනු අංකය වන්නේ එක් එක් ඡන්ද ප්‍රදේශය අනුව සකස් වූ තැපැල් ඡන්ද නාමලේඛනයෙහි සඳහන් අනු අංකය වේ. වැඩිදුර උපදෙස් සඳහා තැපැල් ඡන්ද නිකුත් කිරීමේ ක්‍රියාපිළිවෙල සම්බන්ධව නිකුත් කර ඇති උපදෙස් මාලාවේ සහ ගැලීම් සටහනේ ඇති උපදෙස් කෙරෙහි සැලකිලිමත් වන්න. අදාළ උපදෙස් මාලාවේ උධෘතයක් යා කර ඇත. (PRE/2024/09)

**18. නිකුත් කිරීම් කණ්ඩායම් භාර සහකාර තේරීම්භාර නිලධාරීන් විශේෂයෙන් සැළකිලිමත් විය යුතු කරුණු**

18.1 තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුවේ තැපැල් ඡන්දදායකයන්ගේ නමට අදාළ අනු අංකය, ඡන්ද පත්‍රිකාවේ උප පත්‍රිකාවෙහි සටහන් කිරීම නිවැරදිව ඉටු කරන බවට නිසැක විය යුතු ය.

18.2 ඡන්ද පත්‍රිකාවේ පිටුපස ඇති අනුක්‍රමික අංකය B කවරයේ සහ අනන්‍යතා ප්‍රකාශයේ සටහන් කිරීම නිවැරදිව ඉටුවන බව, ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ ආරම්භක අවස්ථාවේ දී විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

18.3 ඡන්දදායකයාගේ නම C කවරයේ නිවැරදිව සටහන් කර තිබේ ද යන්න පරීක්ෂා කළ යුතු ය.

18.4. තැපැල් ඡන්දදායකයාගේ නම, සහතික කිරීමේ නිලධාරීගේ නම සහ ලිපිනය D කවරයෙහි නිවැරදිව සටහන් කර තිබේ ද යන්න පරීක්ෂා කළ යුතු ය.

18.5 A කවරයේ නියමිත ස්ථානයේ තේරීම්භාර නිලධාරීන්ගේ/ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්ගේ නිල මුද්‍රාව තබා තිබේ ද, ඡන්දදායකයාගේ අනු අංකය ඇතුළත් QR කේතය අලවා තිබේ ද යන කරුණු පරීක්ෂා කළ යුතු වේ.

18.6 ඡන්ද පත්‍රිකාවේ පසුපස ඉඩ ඇති ස්ථානයක නිල ලකුණ (රහස්‍ය මුද්‍රාව) තැබීම සැලකිල්ලෙන් ඉටු කරනු ලබන බව නිසැක වීම ද අත්‍යවශ්‍ය ය.

18.7 සලකුණු කරනු ලැබූ තැපැල් ඡන්ද පත්‍රිකාවේ ආපසු එවීම සඳහා භාවිතා කරන B කවරය, ඡන්ද පත්‍රිකාව, අනන්‍යතා ප්‍රකාශය, A කවරය සහ A කවරයට අලවන අළු පැහැති ස්ටිකරය යන සියල්ලක් නියමිත පරිදි එකට තබා ඇති බවට සහකාර තේරීම්භාර නිලධාරී විසින් පෞද්ගලිකව සෑහීමකට පත්විය යුතු අතර අනතුරුව ඒ සියල්ල C කවරයේ බහා මුද්‍රා තබා නැවත D කවරය තුළ බහා ගම් ගා අලවා ඒ මත ස්ටිකරය ඇලවිය යුතු ය.

18.8 තැපැල් කාර්යාලය වෙත මෙම රක්ෂණ පැකට්ටු භාරදීම සඳහා අදාළ නිවේදන පත්‍ර පිටපත් දෙකකින් යුතුව සකස් කර ලැබී තිබේ ද යන බව සහතික කර ගන්න. මේ සඳහා තැපැල් ඡන්ද නාමලේඛනයේ පිටපත් දෙකක් වුව ද යොදා ගත හැකි ය.

18.9 රක්ෂණ තැපැල් ඡන්ද පැකට්ටු තැපැල් කාර්යාලයෙන් බාරගත් බවට කුවිතාන්සි නිවැරදිව ලැබෙන බව හා එම කුවිතාන්සිවල සංඛ්‍යාව, නිකුත් කළ ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව සමග ගැලපෙන බව තහවුරු කර ගත යුතු ය. ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම අවසානයේ භාරදුන් පැකට්ටු සංඛ්‍යාව භාරගත් බවට කුවිතාන්සි ඇත්දැයි පරීක්ෂා කර එම කුවිතාන්සි එක් එක් නිකුත් කිරීමේ මධ්‍යස්ථානයේ සහකාර තේරීම්භාර නිලධාරී විසින් තමාගේ ජර්නලය සමග ගොනු කළ යුතු ය.

18.10 සහතික කිරීමේ නිලධාරීන් වෙත යැවෙන සෑම කවරයකටම නියමිත පරිදි ඡන්ද පත්‍රිකාව, අනන්‍යතා ප්‍රකාශය, අලු පැහැති ස්ටිකරය ඇතුළත් කළ බව සනාථ කර ගැනීම සඳහා නිකුත් කරන සෑම ඡන්ද පත්‍රිකා පනහකට වරක් ඉතිරි ඡන්ද පත්‍රිකා, අනන්‍යතා ප්‍රකාශ, ස්ටිකර සංඛ්‍යාව පරීක්ෂා කර බැලිය යුතු ය.

**19. තැපැල් ඡන්ද නිකුත් කිරීම අවසන් කිරීම.**

තැපැල් ඡන්ද ලැයිස්තුවට අදාල කොටසෙහි නම් සඳහන් සියලුම ඡන්දදායකයින් වෙත ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමෙන් පසු පහත සඳහන් ලිපි ලේඛන, නියමිත පරිදි අදාළ කවරවල බහා මුද්‍රා තබා නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස් වෙත භාරදිය යුතු බව නිකුත් කිරීමේ කණ්ඩායම් භාර සහකාර තේරීම්භාර නිලධාරී වෙත දැන්විය යුතු ය.

- ඉතිරි ඡන්ද පත්‍රිකා
  (සහකාර තේරීම්භාර නිලධාරී වෙත ඔබ වෙත බාර දෙන ලද ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව, නිකුත් කළ සංඛ්‍යාව හා ඉතිරි ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව සමග සැසඳී තිබිය යුතු ය.)
- භාවිතා කළ තැපැල් ඡන්ද ලැයිස්තුව
- නියෝජිත/ නිලධාරී/ කාර්ය මණ්ඩල පැමිණීමේ ලේඛන
- අත්සන් කළ රහස්‍ය ආකෘති
- රහස්‍ය මුද්‍රාව
- කාර්ය පරිපාටි සංග්‍රහය (තැපැල් කාර්යාලයෙන් ලැබුණු ලදුපත් ඇමුණිය යුතු වේ.)

## 20 තැපැල් ඡන්ද පැකට්ටු සම්බන්ධයෙන් සහතික කිරීමේ නිලධාරී වෙත පැවරෙන වගකීම්

20.1 සහතික කිරීමේ නිලධාරීන් විසින් තම කාර්යාලයේ/ ආයතනයෙහි තැපැල භාරව කටයුතු කරන නිලධාරීන් දැනුම්වත් කර තමාගේ නමට ලැබෙන රක්ෂණ තැපැල් ඡන්ද පැකට්ටු , ලිපි, විවෘත කිරීමකින් තොරව අප්‍රමාදව තමා වෙතම ලැබෙන පරිදි වැඩපිළිවෙළ සකස් කළ යුතු ය.

20.2. මෙම කාල සීමාව තුළ දී හැකිතාක් දුරට ක්ෂේත්‍ර නිරීක්ෂණ හා පරීක්ෂණ වැනි රාජකාරි කටයුතු සඳහා කාර්යාලයෙන් බැහැර වීම සීමා කිරීම හෝ එම රාජකාරි සඳහා ඉදිරි දින යොදා ගැනීම.

20.3 තමා වෙත තැපැල් මගින් ලැබෙන රක්ෂණ පැකට්ටු විවෘත කිරීමකින් තොරව සුරක්ෂිතව ගබඩා කර ගත යුතු ය. එමෙන්ම රක්ෂණ තැපැල් ඡන්ද පැකට්ටු ලැබෙන පරිදි ඊට අදාළ තොරතුරු ජර්නලයේ සටහන් කළ යුතු ය.

20.4 තැපැල් ඡන්ද සලකුණු කිරීම සඳහා නියම කර ඇති දිනවලට අදාළව එක් එක් දිනයට කැඳවන තැපැල් ඡන්දදායකයින් නම් වශයෙන් තීරණය කර අයදුම්කරුවන්ට කල්තබා දැනුම් දිය යුතු ය.

20.5 එම කටයුතු නිරීක්ෂණ සඳහා එක් නියෝජිතයකු බැගින් සහභාගී කරවන ලෙස අපේක්ෂකයින්/ බලයලත් නියෝජිතයන් වෙත දැනුම් දිය යුතු ය. **( PRE/2024/09/F6)**

20.5 තැපැල් ඡන්දදායකයින් වශයෙන් පැමිණෙන පුද්ගලයින්ගේ ඡන්ද පත්‍රිකා අඩංගු පැකට්ටු විවෘත කිරීමට පෙර ඡන්දදායකයාගේ හැඳුනුම්පත අනුව අනන්‍යතාව තහවුරු කර ගැනීම අත්‍යවශ්‍ය ය.

20.7 ඡන්ද පත්‍රිකාව රහස්‍ය ආකාරයෙන් සලකුණු කිරීමට ඡන්දදායකයින්ට අවස්ථාව සලසා දිය යුතු ය.

20.8 සළකුණු කරන ලද ඡන්ද පත්‍රිකාව රහස්‍යභාවය රැකෙන පරිදි තැපැල් ඡන්දහිමියා ඉදිරියේදීම නියමිත කවරවල බහා මුද්‍රා තබා එදිනම අදාළ තේරීම්භාර නිලධාරී වෙත රක්ෂණ තැපෑලෙන් යැවීම සඳහා තැපැල් කාර්යාල වෙත භාරදිය යුතු ය. මේ සඳහා කල් තබා අදාළ තැපැල් කාර්යාලය සමග සාකච්ඡා කිරීම සුදුසු ය.

20.9 මෙම කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා අපේක්ෂකයින්/ බලයලත් නියෝජිතයින් විසින් පත් කරන ලද නියෝජිතයින්ට සහ මැතිවරණ කොමිෂන් සභාව විසින් අවසර දෙනු ලබන මැතිවරණ නිරීක්ෂණ සංවිධානවලින් නම් කරනු ලබන නිරීක්ෂකයින්ට ක්‍රියාවලිය නිරීක්ෂණයට අවස්ථාව සලසාදිය යුතුය. **( PRE/2024/09/F5)**

20.10 තේරීම්භාර නිලධාරී විසින් තැපැල් ඡන්ද සලකුණු කිරීමේ කටයුතු නිරීක්ෂණය සඳහා එවනු ලබන සහකාර තේරීම්භාර නිලධාරීන්ට ද ඒ සඳහා පහසුකම් සැලසිය යුතුය.

20.11 ඉහත සඳහන් කරුණු සහතික කිරීම් නිලධාරී උපදෙස් පන්ති වලදී මෙන්ම නිරීක්ෂණ උපදෙස් පන්තිවලදීද අවධානය යොමු කළ යුතු වේ.

## 21. තැපැල් ඡන්ද සලකුණු කිරීම හා නිරීක්ෂණය කිරීම.

21.1 අදාළ සහතික කිරීමේ නිලධාරී විසින් ඡන්ද පත්‍රිකා සලකුණු කරන දිනය, එම කටයුතු ආරම්භ කරන වේලාව සහ ස්ථානය පිළිබඳව අපේක්ෂකයින්/ බලයලත් නියෝජිතයින්ට දැනුම්දිය යුතු ය. **(PRE/2024/09/F6)**

21.2 තැපැල් ඡන්ද සලකුනු කිරීමේ කටයුතු යථා පරිදි ඉටුවන බව නිරීක්ෂණය කිරීම සඳහා අපේක්ෂකයින්/ බලයලත් නියෝජිතයින් විසින් පත්කරන ලද තැනැත්තන්ට අමතරව විධිමත් පත්වීම් ලද නිරීක්ෂණ සංවිධානවල නිරීක්ෂණයන්ට ද අවසර දිය යුතු ය. ආදර්ශ ආකෘතියක් මේ සමඟ ඇත. **(PRE/2024/09/F7)** ඊට අමතරව පූර්ව ඡන්ද විමසීම්වල දී ලද අත්දැකීම් අනුව තේරීම්භාර නිලධාරීට, නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්/ සහකාර මැතිවරණ කොමසාරිස්ට අවශ්‍ය යැයි හැඟෙන ස්ථාන වෙත ද සහකාර තේරීම්භාර නිලධාරීවරයෙකු බැගින් හෝ මෙම කාර්යය පිළිබව අත්දැකීම් සහිත රාජ්‍ය කළමණාකරණ සේවයේ හෝ සමාන්තර සේවයක නිලධරයකු නිරීක්ෂණ කටයුතු සඳහා පත්කළ හැකි ය.

21.3 තැපැල් ඡන්ද සලකුණු කිරීමේ දින නිරීක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම පිළිබඳව වැඩිදුර විස්තර පසුව දන්වා එවනු ලැබේ.

**22. තේරීම්භාර නිලධාරී වෙත ලැබෙන සලකුණු කරන ලද ඡන්ද පත්‍රිකා සහිත රක්ෂණ පැකට්ටු ලේඛනගත කර ගැනීම හා තැපැල් ඡන්ද පෙට්ටියට බහාලීම.**

22.1 තැපැල් ඡන්ද පෙට්ටි තබා ඇති පරිශ්‍රය තුළ තිබෙන කාර්යාලවල සහතික කිරීමේ නිලධාරීන්ට තැපැල් ඡන්දදායකයන් විසින් ඡන්ද පත්‍රිකා සලකුණු කළ දිනයේ දීම ආවරණ ලිපියක් සහිතව අදාළ පැකට්ටු අතින් ගෙනවිත් භාරදිය හැකිය.

22.2 අනෙකුත් කාර්යාලවල සහතික කිරීමේ නිලධාරී විසින් ඡන්ද පත්‍රිකා සලකුණු කරනු ලබන දිනයේ දීම අදාළ පැකට්ටු තැපැල් කාර්යාලය වෙත බාරදිය යුතු ය. ඒ ආසන්න දිනවල තැපැල් මගින් තේරීම්භාර නිලධාරී වෙත ලකුණු කරන ලද ඡන්ද පත්‍රිකා අඩංගු පැකට්ටු ලැබෙනු ඇත.

22.3 තේරීම්භාර නිලධාරී වෙත ලැබෙන තැපැල් ඡන්ද පැකට්ටු ඉතාම සැලකිල්ලෙන ලේඛනගත කර තැපැල් ඡන්ද පෙට්ටිවල බහාලිය යුතු ය. ආපසු ලැබෙන "A" කවරවල QR කේතය සටහන් කොට තිබෙන බැවින් ඒවා පරිලෝකනය (Scan) කිරීමෙන් ද ලේඛනගත කළ හැකි වේ. අනතුරුව දෛනිකව තැපැල් ඡන්ද පෙට්ටි මුද්‍රාතබා ආරක්ෂිතව තැබිය යුතුය.

22.4. තැපැල් ඡන්ද පැකට්ටු භාර ගැනීමේ විෂය භාර සහකාර තේරීම්භාර නිලධාරී විසින් ඡන්ද පෙට්ටියට බහාලූ පැකට්ටු සංඛ්‍යාව පිළිබඳ වාර්තාවක් තේරීම්භාර නිලධාරී වෙත භාරදිය යුතු ය. ඒ සමග රක්ෂණ පැකට්ටු ලැබීම් සටහන් කරන ලද ලේඛන ද කවරයක බහා මුද්‍රා තබා තේරීම්භාර නිලධාරී වෙත භාරදිය යුතු ය. තැපැල් ඡන්ද පැකට්ටු ගණන් කිරීම සඳහා භාරදීම පිළිබඳව උපදෙස් පසුව දන්වා එවනු ලැබේ.

22.5 සලකුණු කොට ලැබෙන තැපැල් ඡන්ද පැකට්ටු බහාලන ඡන්ද පෙට්ටි තබා ඇති ස්ථානයට විධිමත් පොලිස් ආරක්ෂාවක් ලබාදිය යුතු වේ.

**23. සහතික කිරීමේ නිලධාරීන් වෙත ඉතිරි වී ඇති පැකට්ටු**

23.1 තැපැල් ඡන්ද සලකුණු කිරීමට නියමිත දිනවල දී ඡන්ද හිමියන් විසින් සලකුණු නොකරන ලද තැපැල් ඡන්ද අඩංගු කවර එම කටයුතු නිරීක්ෂණයට පැමිණෙන සහකාර තේරීම්භාර නිලධාරී මගින් පිටපත් දෙකකින් සම්පූර්ණ කරන PV-RT ආකෘතියට අනුව ආපසු දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත ගෙන්වා ගැනීමට සුදුසු වැඩ පිළිවෙලක් සකසා ඒ පිළිබඳව සහතික කිරීමේ නිලධාරීන් දැනුම්වත් කරන්න. **(PRE/2024/09/F8)**

23.2 තැපැල් ඡන්ද සලකුනු කරනු ලබන දිනවල දී නිරීක්ෂණයට ලක් නොවන ස්ථානවල ඉතිරි තැපැල් ඡන්ද අඩංගු කවර, තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීමේ අවසාන දිනයට පසු දිනම ඔබ වෙත අතින් ගෙනවිත් භාරදෙන ලෙස සහතික කිරීමේ නිලධාරීන් දැනුම්වත් කිරීමට කටයුතු කළ යුතු ය. සහතික කිරීමේ නිලධාරී භාරයේ සලකුණු නොකොට එසේ ඉතිරි වන තැපැල් ඡන්ද පැකට්ටු ඔබ වෙත ලැබෙන බවට සහතික වීම අත්‍යාවශ්‍ය වේ.

23.3 ලකුණු නොකළ පැකට්ටු නිරීක්ෂණය සඳහා යවනු ලබන සහකාර තේරීම් භාර නිලධාරීන් මගින් එකතු කරගත හැක. ඒ සඳහා නිශ්චිත වේලාවන් හා භාරගැනීමේ ස්ථාන (ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වැනි) දැනුම් දී තිබිය යුතුය.

23.4 සලකුණු නොකරන ලද තැපැල් ඡන්ද පත්‍රිකා සලකුණු කිරීමේ අමතර දින පිළිබඳව පසුව දැනුම් දීමට කටයුතු කරනු ලැබේ.

**24.** තැපැල් ඡන්ද පැකට්ටු පිළිබඳ සමාලෝචනය .

24.1 ඡන්ද විමසීම් දින දක්වා ලැබුණු සලකුණු කරන ලද තැපැල් ඡන්ද පැකට්ටු සංඛ්‍යාව

24.2 සලකුණු කරන ලද එහෙත් ප්‍රමාද වී ලැබුණු පැකට්ටු සංඛ්‍යාව (A කවර)

24.3 ඡන්දය ප්‍රකාශ නොකර ඉතිරි පැකට්ටු (D කවර) වශයෙන් ලැබුණු සංඛ්‍යාව පිළිබඳව සටහන් තබා ගත යුතු ය.

අනතුරුව ඉහත සඳහන් තුන් ආකාරයෙන්ම තමාට නොලැබුණු පැකට්ටුවල අනු අංකය අනුව එම පැකට්ටු පිළිබඳව අදාළ සහතික කිරීමේ නිලධාරීන්ගෙන් වාර්තාවක් ගෙන්වා ගත යුතු ය. ඉහත කී වාර්තා කොමිෂන් සභාවේ නිරීක්ෂණය සඳහා ද යොමු කළ යුතු බව කාරුණිකව දන්වමි.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

පිටපත

01. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් වෙත - දැන ගැනීම සඳහා

02. චන්න පී. ද සිල්වා මහතා, අධ්‍යක්ෂ (පර්යේෂණ හා ක්‍රම සම්පාදන) - සියළු මෙහෙයුම් හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සඳහා

03. රංජන් නිශාන්ත මහතා සහකාර අධ්‍යක්ෂ,(තොරතුරු තාක්ෂණ) - දැන ගැනීම පිණිස හා අවශ්‍ය තාක්ෂණ උපදෙස් ලබාදීම සඳහා



සභාපති
தவிசாளர்
දුරකථන/தொலைபேசி:011-2868444
ෆැක්ස්/தொலைநகல்:011-2868445
e-mail : chairman@elections.gov.lk

මැතිවරණ කොමසාරිස් ජනරාල්
Nju;jy;fs; Mizahhsu; ehafk;
දුරකථන/தொலைபேசி:011-2885207
ෆැක්ස්/தொலைநகல்:011-2885208
e-mail: cgelection@elections.gov.lk

අතිරේක මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ)
NkyjpfNju;jy;fs; Mizahhsu; (Njrpaj; Nju;jy;fs);
දුරකථන/தொலைபேசி: 011-2868447
ෆැක්ස්/தொலைநகல்:011-2868368

(තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගැනීම අවසන් වූ පසු හැකි ඉක්මනින් 0112868169 අංකය වෙත ෆැක්ස් හෝ dc.ne@elections.gov.lk ඊ තැපැල මගින් ප්‍රධාන කාර්යාලය වෙත එවිය යුතු ආකෘතිය.)

PRE/2024/09/F1

# ජනාධිපතිවරණය - 2024
## තැපැල් ඡන්ද අයදුම්පත් පිළිබඳ විස්තර

මැතිවරණ කොට්ඨාශය :- ..........................................................

| ඡන්ද ප්‍රදේශය | ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව | පිළිගත් අයදුම්පත් සංඛ්‍යාව | ප්‍රතික්ෂේපිත අයදුම්පත් සංඛ්‍යාව | පිළිගත්/ ප්‍රතික්ෂේප/ තීරණය කර නොමැති අයදුම්පත් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව සහතික කරමි.

නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්

දිනය ........................ ............................................ දිස්ත්‍රික්කය

D:\Hansi\ජනාධිපතිවරණය - 2024\ආකෘති\PRE - F1.docx

(තැපැල් ඡන්ද නාමලේඛනය සහතික කළ පසු හැකි ඉක්මනින් 0112868169 අංකය වෙත ෆැක්ස් හෝ dc.ne@elecions.gov.lk ට තැපැල් කරන්න.)

PRE/2024/09/F2

# ජනාධිපතිවරණය - 2024
## තැපැල් ඡන්ද අයදුම්පත් වර්ග කිරීම

මැතිවරණ කොට්ඨාශය :- ..............................................................

| ඡන්ද ප්‍රදේශය | ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව | පිළිගත් අයදුම්පත් සංඛ්‍යාව | ප්‍රතික්ෂේපිත අයදුම්පත් සංඛ්‍යාව | ප්‍රතික්ෂේප කිරීමට හේතුව | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | රාජකාරි සඳහා යොදා නොගැනීම | තැපැල් ඡන්ද හිමිකම නොමැති වීම | අයදුම්කරුගේ අත්සන නොමැති වීම | විධිමත් ලෙස සහතික කර නොමැති වීම | තොරතුරු වැරදි/ අසම්පූර්ණ තොරතුරු ඉදිරිපත් කිරීම | ප්‍රමාද වී ලද අයදුම්පත් සංඛ්‍යාව |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව සහතික කරමි.

..............................................................
නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්
.......................................... දිස්ත්‍රික්කය

දිනය ........................

D:\Hansi\ජනාධිපතිවරණය - 2024\ආකෘති\PRE - F2.docx

ආදර්ශ ආකෘතිය

PRE/2024/09/F3

දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී,
නිකුත් කිරීමේ මධ්‍යස්ථාන අංකය - ...........................................

ජනාධිපතිවරණය - 2024
තැපැල් ඡන්ද නිකුත් කරන ස්ථානයට නියෝජිතයන් පත් කිරීම

ජනාධිපතිවරණයට අදාළව තැපැල් ඡන්ද නිකුත් කරන බව දැනුම් දෙමින් ඔබ විසින් මා වෙත එවන ලද ...................... දිනැති දැනුම් දීම සම්බන්ධවයි.

02. ජනාධිපතිවරණයේ දී තැපැල් ඡන්ද නිකුත් කිරීමට අදාළව අංක .................................... දරන නිකුත් කිරීමේ මධ්‍යස්ථානයේ කටයුතු නිරීක්ෂණය සඳහා මගේ නියෝජිත වශයෙන් ........................................ මහතා/ මහත්මිය/ මෙනවිය මෙයින් පත් කරමි. ඔහුගේ/ ඇයගේ තොරතුරු පහතින් දක්වා ඇත.

| | නියෝජිතගේ නම | ජාතික හැඳුනුම්පත් අංකය | ලිපිනය |
|---|---|---|---|
| 1. | ....................................... | ......................................... | ....................................... |

03. ජාතික හැඳුනුම්පත තමා අත තබා ගතයුතු බවත්, ජංගම දුරකථන, බෑග්, පාර්සල් ආදී මැතිවරණ කොමිෂන් සභාව විසින් තහනම් කර ඇති කිසිවක් තැපැල් ඡන්ද නිකුත් කිරීමේ මධ්‍යස්ථානය තුළට රැගෙන නොයා යුතු බවටත් ම විසින් උපදෙස් දී ඇත.

...................................................

අපේක්ෂක/ බලයලත් නියෝජිත අත්සන

නම - ................................................

අපේක්ෂකයාගේ නම - ................................................

දිනය ......................

D:\Hansi\ජනාධිපතිවරණය - 2024\ආකෘති\PRE - F3.docx

ජනාධිපතිවරණය - 2024

.............................................මැතිවරණ කොට්ඨාසය

තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කරන බව දැන්වීම

ඉහත කී ඡන්ද විමසීමේ දී අපේක්ෂකයකු/බලයලත් නියෝජිතයෙකු වන *

.............................................................................................

.............................................................................................

.............................................................................................

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ 2 වැනි උපලේඛනය වන, තැපැල් ඡන්ද දායකයන් පිළිබඳ නියෝග වන 10(1) නියෝගය අනුව මෙයින් ඔබ වෙත දන්වා සිටින්නේ;

(අ) 2023 ...............................මස ...................... වැනි දින පෙරවරු / පස්වරු .................... ට ............................................ දී ඉහත කී ඡන්ද විමසීම් තැපැල් ඡන්ද පත්‍රිකා මවිසින් නිකුත් කරනු ලබන බවත්, ඔබට හෝ ඔබ වෙනුවෙන් පෙනී සිටීමට ඔබ විසින් පත් කරනු ලබන වෙන යම් තැනැත්තෙකුට ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ කටයුතුවලදී පැමිණ සිටිය හැකි බව සහ

(ආ) එම ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේදී එහි පැමිණ සිටීමට, 8 වැනි නියෝගයේ (2) වැනි ඡේදය යටතේ ඔබ විසින් පත් කළ හැකි නියෝජිතයන්ගේ සංඛ්‍යාව ................ බවත්ය.

තැපැල් ඡන්දදායකයින්ගේ නියෝගවල 8 සහ 9 වැනි නියෝගවල උපුටනයක් ඔබගේ දැන ගැනීම සඳහා මෙයට අමුණා ඇත.

තේරීම්භාර නිලධාරී

................................... මැතිවරණ කොට්ඨාසය

...................................................................

ලිපිනය - .....................................................

.....................................................

.....................................................

දිනය - .................................

සටහන - යථෝක්ත ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේදී පැමිණ සිටින සෑම තැනැත්තකු විසින්ම 9 වැනි නියෝගයේ නියම කෙරෙන පරිදි තේරීම්භාර නිලධරයා හෝ සාමදාන විනිශ්චයකරුවකු ඉදිරියේ රහස්‍යභාවයේ ප්‍රකාශය කළ යුතුය.

නියෝජිතයා තමාගේ ජාතික හැඳුනුම්පත පැළඳගෙන පැමිණිය යුතු බවත්, පාර්සල්, ජංගම දුරකථන, ගිනි අවි රැගෙන ඒමෙන් වැලකිය යුතු බවත් සලකන්න.

*අනවශ්‍ය වචන කපා හරින්න

PRE/2024/09/F5

(තැපැල් ඡන්ද සලකුණු කරන ස්ථානයට
නියෝජිතයන් පත් කිරීම සඳහා)

..........................................................
..........................................................
..........................................................

(සහතික කිරීමේ නිලධාරීගේ නම, තනතුර සහ ලිපිනය)

ජනාධිපතිවරණය - 2024
තැපැල් ඡන්ද සලකුණු කරන ස්ථානය සඳහා නියෝජිතයින් පත් කිරීම

ජනාධිපතිවරණයට අදාළව ඔබ ආයතනයෙහි තැපෑලෙන් ඡන්දය දීම සඳහා සුදුසුකම් ලැබූවන්ගේ ඡන්ද පත්‍රිකා සලකුණු කරනු ලබන අවස්ථාව නිරීක්ෂණය කිරීම සඳහා .......................................................... .......................................................... අපේක්ෂක වෙනුවෙන් පහත නම් සඳහන් නියෝජිතයින් මෙයින් පත් කරමි. එම නියෝජිතයන්ට අදාළ නිරීක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සලසා දෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

02. ජාතික හැඳුනුම්පත තමා අත තබාගත යුතු බවත්, ජංගම දුරකථන, බෑග්, පාර්සල් ආදී මැතිවරණ කොමිෂන් සභාව විසින් තහනම් කර ඇති කිසිවක් තැපැල් ඡන්ද සලකුණු කරනු ලබන ස්ථානයට රැගෙන නොයායුතු බවත් ම විසින් ඔවුනට උපදෙස් දී ඇත.

1. නියෝජිතගේ නම : ..........................................................................................

   හැඳුනුම්පත් අංකය : ..........................................................................................

   පදිංචි ලිපිනය : ..........................................................................................

   ආදර්ශ අත්සන : ..........................................................................................

2. නියෝජිතගේ නම : ..........................................................................................

   හැඳුනුම්පත් අංකය : ..........................................................................................

   පදිංචි ලිපිනය : ..........................................................................................

   ආදර්ශ අත්සන : ..........................................................................................

..........................................................
අත්සන
බලයලත් නියෝජිත

නම : ..........................................................

අපේක්ෂක නම : ..........................................................

දිනය : ..........................................................

PRE/2024//09/F6

# ජනාධිපතිවරණය - 2024

## තැපැල් ඡන්ද සලකුණු කරන බව දැන්වීම

## තැපැල් ඡන්ද සලකුණු කරන අවස්ථාවේ දී, සහතික කිරීමේ නිලධාරියාගේ කාර්යාලයේ පැමිණ සිටීම සඳහා නියෝජිතයන් පත් කිරීම

.................................................................................................................................

(අපේක්ෂකයාගේ නම)

බලයලත් නියෝජිත

.................................................................................................................................

(නම)

මෙම කාර්යාලයේ/ ඒකකයේ/ ආයතනයේ මුළු තැපැල් ඡන්ද සලකුණු කිරීමට දායක සංඛ්‍යාව වන නිලධාරීන් ..........................ක් ...................................... දින පෙ.ව./ප.ව ............................ ට .................................................................................................................................

(කාර්යාලයේ ලිපිනය)

කාර්යාලයේ දී තම තමන්ගේ තැපැල් ඡන්ද සලකුණු කරන බව දන්වමි. ඔබට හෝ ඔබ වෙනුවෙන් පෙනී සිටීමට ඔබ විසින් පත් කරනු ලැබූ නියෝජිතයකුට තැපැල් ඡන්ද සලකුණු කරන අවස්ථාවට සහභාගී විය හැකි බව දන්වමි.

02. කරුණාකර පැමිණෙන නියෝජිතයන් පහත දැක්වෙන උපදෙස් පිළිපැදිය යුතුවේ.

2.1 ජාතික හැඳුනුම්පත හෝ වෙනත් හැඳුනුම්පතක් තමා ළඟ තබා ගැනීමට හෝ වඩාත් යෝග්‍ය පරිදි එය පැළඳ සිටීමට ; සහ

2.2 ඡන්ද මධ්‍යස්ථානයට හෝ එම භූමියට පාර්සල්, බෑග් හෝ බහාලූ කිසිවක් ගෙන යාමෙන් වැලකී සිටීමට

03. තවද පත් කිරීමේ ලිපියේ ඔහුගේ/ ඇයගේ අත්සන සහතික කරන ලෙස ද ඉල්ලා සිටිමි.

04. මෙම ස්ථානය රජයේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ කාර්යාලයක්/ වැඩපලක් වන බැවින් ද, කාර්යාල වේලාවන් තුළ තැපැල් ඡන්ද සලකුණු කිරීම සිදු කරන බැවින් ද පරිපාලනමය නීති තරයේ පිළිපැදිය යුතු වේ. ඉහත 02 සහ 03 ඡේදවල නියමයන් පිළිපැදීමට අපොහොසත් වන කවරකුට වුවද මෙම ස්ථානයට ඇතුල්වීම ප්‍රතික්ෂේප කිරීමට අකමැත්තෙන් වුවද සිදුවනු ඇත.

...................................................

දිනය : .........................

සහතික කිරීමේ නිලධරයාගේ අත්සන

සහතික කිරීමේ නිලධරයාගේ නම සහ නිල ලිපිනය

...........................................................

...........................................................

...........................................................

...........................................................

...........................................................

PRE/2024//09/F7

ආදර්ශ ආකෘතිය

දිස්ත්‍රික් භාරකාර නිලධාරී,
නිකුත් කිරීම් මධ්‍යස්ථාන අංකය - ................................

ජනාධිපතිවරණය - 2024
තැපැල් ඡන්ද නිකුත් කරන ස්ථානයට නිරීක්ෂකයින් පත් කිරීම.

තැපැල් ඡන්ද නිකුත් කරන බව දැනුම් දෙමින් ඔබ විසින් මා වෙත එවන ලද ................ දිනැති දැනුම් දීම සම්බන්ධවයි.

02. ජනාධිපතිවරණයේ දී තැපැල් ඡන්ද නිකුත් කිරීමට අදාළව අංක ................................ දරන නිකුත් කිරීමේ මධ්‍යස්ථානයේ කටයුතු නිරීක්ෂණය සඳහා ........................................................................ මැතිවරණ නිරීක්ෂණ සංවිධානයේ නියෝජිත වශයෙන් ........................................................... මහතා/ මහත්මිය/ මෙනවිය මෙයින් පත් කරමි. ඔහුගේ/ ඇයගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය සහ ලිපිනය පහත දක්වා ඇත.

| නියෝජිතගේ නම | ජාතික හැඳුනුම්පත් අංකය | ලිපිනය |
|---|---|---|
| ............................................... | ....................................... | .................................................... |

03. ජාතික හැඳුනුම්පත තමා අත තබා ගත යුතු බවත් ජංගම දුරකථන, බෑග්, පාර්සල් ආදී කිසිවක් තැපැල් ඡන්ද නිකුත් කරන ස්ථානයට රැගෙන නොයායුතු බවටත් ම විසින් උපදෙස් දී ඇත.

..................................................................
විධායක අධ්‍යක්ෂ/ විධායක සම්බන්ධීකාරක

නම - ....................................................................................................

මැතිවරණ නිරීක්ෂණ සංවිධානය - .........................................................

දිනය - ..................................

(පිටපත් දෙකකින් සම්පූර්ණ කරන්න)

PV - RT

PRE/2024/09/F8

නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්,

මැතිවරණ කාර්යාලය, ..............................

සහතික කිරීමේ නිලධාරියාගේ නම - ...............................................................................
තනතුර - ...........................................................
කාර්යාල ලිපිනය - ....................................................................................................
..............................................................
දුරකතන අංකය - රාජකාරී ..............................
ජංගම ..............................

ජනාධිපතිවරණය 2024 ..............

නියමිත දිනවල දී සලකුණු නොකළ තැපැල් ඡන්ද පැකට්ටු ආපසු භාරදීම

| අනු අංකය | තැපැල් ඡන්ද දායකයාගේ නම | මැතිවරණ කොට්ඨාසය | රක්ෂණ ලිපි කවර අංකය |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |
| 05 | | | |
| 06 | | | |
| 07 | | | |
| 08 | | | |
| 09 | | | |
| 10 | | | |
| 11 | | | |
| 12 | | | |

තැපැල් ඡන්දය ලකුණු කිරීමට නියමිතව තිබූ දෙදින තුළ සලකුණු නොකරන ලද, ඉහත නම සඳහන් තැපැල් ඡන්ද අයදුම්කරුවන්ට අදාළ "D" කවර ................ .ක් මෙ සමඟ ආපසු භාරදීමට පියවර ගන්නා ලදී.

දිනය - ...................................

.......................................................

සහතික කිරීමේ නිලධාරියාගේ අත්සන

නිල මුද්‍රාව -


| | |
|---|---|
| ආපසු භාරදුන් පැකට්ටු ගණන - ............................ | භාරගත් පැකට්ටු ගණන - .................................. |
| ආපසු භාරදුන් අයගේ නම - ................................. | භාරගත් අයගේ නම - ...................................... |
| තනතුර - .............................................. | තනතුර - ...................................... |
| අත්සන- ................................................ | සඳහන් කළ යුතු විශේෂ කරුණක් ඇතොත් - ............................................................ |
| දිනය - .................................. | භාරගත් බවට අත්සන - ................................ |
| | දිනය- .................................. |

# තැපැල් ඡන්ද නිකුත් කිරීමේ කණ්ඩායම් සඳහා උපදෙස්

තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කරනු ලබන ස්ථානය සකස් විය යුතු ආකාරය සහ එක් එක් නිලධාරියා වෙත පැවරෙන කාර්යභාරය පිළිබඳ මඟ පෙන්වීමේ සටහන


**ඡන්ද ප්‍රදේශ භාර නිලධාරී**

- සකස් වන තැපැල් ඡන්ද පැකට්වූ තැපැල් ඡන්ද ලැයිස්තුව අනුව හරි වැරදි බලමින් තැපැල් ඡන්ද කාර්යාලය වෙත භාර දීම සඳහා නිවේදන පත්‍ර පිටපත් දෙකකින් යුතුව සකස් කළ යුතුය.
- තැපැල් ඡන්ද නිකුත් කිරීම ආරම්භ වූ මොහොතේ සිට සකස් වන ඡන්ද පත්‍රිකා පැකට්වූ වරින් වර තැපෑලට භාර දීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් කල් තබා සූදානම් කර ගත යුතුය.
- තැපැල් ඡන්ද නිකුත් කිරීම අවසානයේ තැපැල් කාර්යාලයෙන් භාර ගත් බවට නිකුත් වූ කුවිතාන්සි පරික්ෂා කර නිකුත් කළ සෑම පැකට්වුවක් සඳහා ම කුවිතාන්සි ලැබී ඇති බව තහවුරු කර ගත යුතුය.




## 1 වැනි නිලධරයා


- තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුව මත ඡන්දදායකයාගේ නම සහ අනු අංකය හඬනගා කියවා. එසේ කියවනු ලැබූ ඡන්දදායකයාගේ අනු අංකය ඉදිරියෙන් (-) සලකුණක යෙදිය යුතු ය.
- ඡන්දදායකයාගේ නම හඬ නගා කියවන විට "D" කවරයේ කල්තියා ලියා ඇති ඡන්දදායකයාගේ නම සහ සහතික කිරීම් නිලධාරිගේ නම සහ ලිපිනය නිවැරදිදැයි පරීක්ෂා කළ යුතු ය.
- ඉන් පසු D කවරය හා C කවරය එකට තබා සහකාර තේරීම්භාර නිලධාරී වෙත භාර දිය යුතුවේ.



තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුව




"Dකවර "ය





"Cකවර "ය

## 2 වැනි නිලධරයා

- හඬ නගා කියවනු ලැබූ ඡන්දදායකයාගේ අනුඅංකය ඡන්ද පත්‍රිකාවේ උපපත්‍රිකාවේ (Counterfoil) වෙන්කර ඇති ඉඩ මත සටහන් කළ යුතු ය. (ඡන්ද දායකයාගේ අංකය ලෙස සටහන් කර ඇති ස්ථානයේ)
- ඡන්දදායකයාට නිකුත් කරනු ලබන ඡන්ද පත්‍රිකාව පිටුපස, පහළ වම් කෙලවරේ නිල සලකුණ තබා, ඡන්ද පත්‍රිකාව ඡන්ද පත්‍රිකා පොතෙන් අඩිරුල තබා ප්‍රවේශමෙන් වෙන් කළ යුතු ය.
- නරක් වූ ඡන්ද පත්‍රිකාවක් හමුවුවහොත් වහාම කාර්යය නවතා නි.මැ.කො./ ස.මැ.කො.දැනුවත් කරන්න.
- ඡන්දදායකයාට නිකුත් කරන ලද ඡන්ද පත්‍රිකාව රැගෙන එම ඡන්ද පත්‍රිකාවේ පිටුපස මුද්‍රණය කර ඇති අංකය,
  (අ) අනන්‍යතා ප්‍රකාශය මත සහ
  (ආ) ඡන්ද පත්‍රිකා කවරය (B කවරය) මත සටහන් වී තිබේද යන්න පරීක්ෂා කළ යුතුවේ. සටහන් වී නොමැති නම සටහන් කිරීම හා වෙනසක් ඇත්නම් නිවැරදි කිරීම කළ යුතු වේ.





අනන්‍යතා ප්‍රකාශය




"Bකවර "ය

## 3 වැනි නිලධරයා

- "A" කවරය මත මුද්‍රණය කර ඇති මැතිවරණ කොට්ඨාසයේ අංකය හා නම තේරීම්භාර නිලධාරීගේ ලිපිනය සහ කවරයේ පහළ වම් කෙළවරේ ඇති තැපැල් මුද්‍රාව නිවැරදිව තිබේදැයි පරීක්ෂා කළ යුතුය.
- අංක 1 ලිපිකරු ප්‍රකාශ කරන ඡන්ද දායකයාගේ අනු අංකය A කවරය මත අලවා ඇති QR code හි නිවැරදිව සඳහන්ව ඇත්දැයි පරීක්ෂා කරන්න.
- "A" කවරය හරි වැරදි බැලීමෙන් පසුව එම කවරය සහ ආපසු එවීම සඳහා සකස්වන පැකට්ටුව (A - කවරය) සඳහා අවශ්‍ය අළුපැහැති ස්ටිකරය සමඟ 2 ලිපිකරුගෙන් ලැබෙන අනන්‍යතා ප්‍රකාශය, "B" කවරය සහ ඡන්ද පත්‍රිකාව Clip කටුවකින් අමුනා සහකාර තේරීම්භාර නිලධාරි වෙතට දිය යුතු ය.



"A" කවරය




"A" කවරයේ ඇලවිය යුතු අළුපැහැති ස්ටිකරය

## සහකාර තේරීම්භාර නිලධරය (ස.තේ.නි.)

- "C" කවරය, "D" කවරය 1 වන නිලධරයාගෙන් ලබා ගත යුතුය
- අළු පැහැති ස්ටිකරය ඡන්ද පත්‍රිකාව, අනන්‍යතා ප්‍රකාශය, ඡන්ද පත්‍රිකා කවරය "B" හා "A" කවරය, 3 වැනි ලිපිකරුගෙන් ලබාගත යුතුය.
- ඡන්ද පත්‍රිකා කවරයේ සහ අනන්‍යතා ප්‍රකාශයේ යොදා ඇති අංක, ඡන්ද පත්‍රිකාවේ අංකය සමඟ සැසඳේ දැයි නැවත වරක් හරි වැරදි බැලිය යුතු ය.
- "D" කවරය මත සටහන් කර ඇති QR code හි ඇති අංකය "A" කවරය මත සටහන් කර ඇති QR code හි ඇති අංකය සමඟ සැසඳේ දැයි නැවත වරක් පරීක්ෂා කොට නිරවද්‍යතාව සනාථ කර ගත යුතු ය.

## කවර මුද්‍රා තබන නිලධාරයා

- පළමුව "සී" කවරය මුද්‍රා තබා නොමැති නම අදාළ පරිදි මුද්‍රා තැබිය යුතු ය.
- ඊට පසු "සී" කවරය "ඩී" කවරය තුළ බහා අලවා උපදෙස් දී ඇති පරිදි මුද්‍රා තබා කහ පැහැති ස්ටිකරය ඇලවිය යුතු ය.




"D" කවරයේ ඇලවිය යුතු කහපැහැති ස්ටිකරය


PRE/2024/09/A

## මැතිවරණ ඊ-සේවා ගිණුමක් සාදා ගැනීම

01. මැතිවරණ ඊ-සේවා ගිණුමක් සාදා ගැනීම සඳහා https://eservices.elections.gov.lk යන මැතිවරණ ඊ-සේවා වෙබ් අඩවියට පිවිස එහි SignUp වෙත යොමු වන්න.



02. එවිට ගිණුම සකසා ගැනීම සඳහා ගිණුම සකසා ගන්නා අයගේ තොරතුරු ඇතුළත් කළ යුතු තිරයට යොමු වේ.




03. එහි ඉල්ලා ඇති තොරතුරු ඉංග්‍රීසි භාෂාවෙන් ඇතුළත් කරන්න. මේ සඳහා ගිණුම සකස් කරගන්නා අයගේ පුද්ගලික තොරතුරු ඇතුළත් කළ යුතුය. කිසිදු හේතුවක් මත රාජකාරී තොරතුරු හෝ වෙනත් අයෙකුට අයත් තොරතුරු ඇතුළත් නොකළ යුතුය.

මෙහි දී,

**SLIN / NIC:**

ජාතික හැඳුනුම්පත් අංකය නිවැරදිව ඇතුළත් කරන්න. එය යළි කිහිප වාරයක් නිවැරදිම දැයි පරීක්ෂා කර බලන්න. එම හැඳුනුම්පත් අංකය ඇතුළත් කළ විට එය අනුසාරයෙන් ඔබට පරිශීලක ගිණුම නාමය ස්වයංක්‍රීයව සැකසෙන අතර එය User Name යන ස්ථානයේ දිස් වේ. මෙම පරිශීලක නාමය ඔබගේ හැඳුනුම්පත් අංකයට සමාන අංක 12කින් යුක්ත වූවකි. එය වෙනස් කිරීමේ හැකියාවක් නැත.

Registered Mobile No :

යටතට ඔබටම අයත් නිතර භාවිතයේ පවතින ජංගම දුරකථන අංකය ඇතුළත් කරන්න. ගිණුමට අදාළ ඉදිරි තොරතුරු කෙටි පණිවුඩ ලෙස මෙම අංකයට ලැබේ.


Email :

යටතට ඔබටම අයත් නිතර භාවිතයේ පවතින පුද්ගලික ඊ-තැපැල් (විද්‍යුත් තැපැල්) ලිපිනය ඇතුළත් කරන්න. ඔබගේ කාර්යාලීය හෝ වෙනත් ඊ-තැපැල් (විද්‍යුත් තැපැල්) ලිපින ඇතුළත් කිරීමෙන් වලකින්න.


**Password :**

යටතට කිසිවකුට අනුමාන කළ නොහැකි, ඔබට පහසුවෙන් මතක තබා ගත හැකි ශක්තිමත් මුරපදයක් සකසා ඇතුළත් කරන්න. ඉදිරි කටයුතුවලදී ඔබගේ පරිශීලක නාමය සමග භාවිතා කළයුතු වන්නේ මෙම මුරපදයයි. මුරපදය ඇතුළත් කළ පසු **Password (Retype)** යන ස්ථානයට යළිත් එම මුරපදයම ඇතුළත් කරන්න.


04. ඉන්පසු පහත ස්ථානයන් හි ☑ සලකුණු කොට **Sign Up** බොත්තම මත ක්ලික් කරන්න.




05. එවිට ඔබ ඇතුළත් කළ ජංගම දුරකථන අංකයට සත්‍යාපන කේතය ලැබෙන අතර එය ඇතුළත් කළ හැකි වන පරිදි තිරය වෙනස් වේ.



06. එම ස්ථානයට ඔබේ ජංගම දුරකථන අංකයට ලැබුණු කේතය ඇතුළත් කරන්න. එවිට ගිණුම සාර්ථකව සැකසී අවසන් වන අතර ගිණුමට ඇතුළු විම සඳහා පරිශීලක නාමය හා මුරපදය විමසන තිරය ලැබේ.




07. එයට ඔබේ පරිශීලක නාමය (ඉලක්කම් 12 යුතු අංකය) හා ඔබ සකසා ගත් මුරපදය ඇතුළත් කර ඉදිරි කටයුතු සඳහා ගිණුමට පිවිසෙන්න.